# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 53 දරන සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 28 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 02 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 5.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

## 2009 අංක 53 දරන සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 28 වන දින]

එල්.ඩී.—ඕ. (අයිඑන්සී) 23/2007.

### සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී ආයතනයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා සමන්තුරේහි පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2009 අංක 53 දරන සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද සංස්ථාවට පූර්ණ බලය සහ අධිකාරය ඇත්තේ ය. සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ඉස්ලාම් ආගමික විශ්වාසය පිළිපදින තැනැත්තන් හට ඉස්ලාමීය මූලධර්ම පදනම් කර ගත් අධ්‍යාත්මික අධ්‍යාපනය හැදෑරීමට මනාව පහසුකම් සැලැස්වීම ;

(ආ) තහ්වා සේවය ඉටු කිරීමට අධ්‍යාපනය ලබන උලමාවරුන් ලෙස නික්ම යන්නා වූ මුස්ලිම් ආගමික භක්තිකයන්ට යහපත අනුශාසානා කොට අයහපත වැළැක්වීමේ සේවයෙහි යෙදීම සඳහා අවශ්‍ය වන පුහුණුවක් ලබා දීම ;

(ඇ) (අ) ඡේදය යටතේ සිය අධ්‍යාත්මික අධ්‍යාපනය ලබා නික්මෙන අයට තම ජීවිතයේ ද, සමාජ ජීවිතයේ ද, ඉස්ලාමීය ජීවන රටාව අනුගමනය කිරීමට හැකිවන පරිදි නායකත්ව පුහුණුවක් ලබා දීම ;

(ඈ) ඉස්ලාමීය ආගමික විශ්වාසය පිළිපදින්නනට මෙකී පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන අනෙකුත් කලාවන් ඉගෙනීමට පහසුකම් සැලැස්වීම ;

(ඉ) ඉස්ලාමීය ආගමික විශ්වාසය පිළිපදින්නන්ගේ ජීවනෝපාය නැංවීමේ අරමුණින් ඔවුන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීම ; සහ

(ඊ) ඉස්ලාමීය ආගමික විශ්වාසය පිළිපදින්නන්ගේ සමාජ, සංස්කෘතික, අධ්‍යාපනික, ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය වන අයුරින් ස්වයං පුහුණුවක් ලබා දීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :—

(අ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ ගනුදෙනු කළ හැකි වෙනත් සාධන පත්‍ර ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක හෝ බැංකුවල ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම හා වැසීම ;

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන්, මුදල් හෝ මුදල්වලට සමාන වෙනත් ද්‍රව්‍යවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීම හා එක්රැස් කිරීම ;

(ඇ) සංස්ථාව වෙත සතු කරනු ලැබූ හෝ සංස්ථාවට හිමි සියලු අරමුදල් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හෝ එම අරමුදල්, ඉඩම්, ගොඩනැගිලි, භාණ්ඩ හෝ ගෘහ භාණ්ඩ මිලට ගැනීම සඳහා යෙදවීම ;

(ඈ) ගොඩනැගිලි ඉදිකිරීම හෝ සංස්ථාවේ ඉඩම්වල හෝ සංස්ථාව විසින් දරනු ලබන වෙනත් ඉඩම්වල ගොඩනැගිලි ඉදිකරවා ගැනීම ;

(ඉ) සංස්ථාවට උපදෙස් ලබා දීමට, සංස්ථාවට අරමුදල් ලබාදීමට හෝ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා අනුග්‍රාහක මණ්ඩලයක් තෝරා පත් කර ගැනීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් විසිපස් දෙනකුගෙන් සමන්විත වන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතු ය.

මහා සභාව.

**6.** (1) මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත මහා සභාවක් තිබිය යුත්තේ ය.

(2) සියලු කාරණාවල දී මහා සභාව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය මහා සභාවේ අනුමතයට යටත්ව මේ පනත යටතේ වූ එහි බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ යම් මහා සභා රැස්වීමක දී හෝ ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාව විසින් කලින් කළ සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, එක් එක් පන්තියේ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු සාමාජික ගාස්තු, සාමාජිකයන් ඇතුළත් කොට ගැනීම, ඔවුන් නෙරපීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ මහා සභාව තෝරා පත් කිරීම, නිලධරයන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් පහ කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මහා සභාවේ බලතල, කාර්යය සහ කටයුතු පවත්වාගෙන යාම ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම, ඔවුන්ගේ බලතල, කාර්යය, කර්තව්‍ය සහ චර්යාව ;

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ, මහා සභාවේ, සංස්ථාවේ සහ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පුරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදන ලද රීති, එම උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම, එවැනිම රැස්වීමක දී, කලින්කල වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ, වෙනස් කරනු ලැබූ, යමක් එකතු කරනු ලැබූ, සංශෝධනය කරනු ලැබූ හෝ පරිච්ඡින්න කරනු ලැබූ සෑම රීතියක් ම මහා සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ පැවති සියලු ණය හා බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතුව තිබුණු සියලු ණය, සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු හා සංස්ථාවට අයවිය යුතු ණය.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ ශක්‍යතාව ඇති අතර, ඒ සියලු දේපළ මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාව සඳහා හෝ වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන සියලු මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ අරමුදල්.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**11.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් සහ විගණනය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා, ලේකම්වරයා සහ භාණ්ඩාගාරිකවරයා ඉදිරියේ දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එවැනි අත්සන් කිරීමක්, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තන් විසින් කර ඇති අත්සනට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**13.** සංස්ථාව ගණන් බේරා වසා දමනු ලැබූ විට හෝ විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය හා බැරකම් බේරුම් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදා දීම එම ආයතනයේ හෝ ආයතනවල රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.